NDB bank

# ජාතික සංවර්ධන බැංකුව පී.එල්.සී

## මූලික කරුණු ලේඛනය

**ව්‍යාපෘති මූල්‍ය අංශය**

| නිපැයුම | විස්තරය | මූල්‍ය සහ වෙනත් ප්‍රතිලාභ | ගත යුතු ක්‍රියා පිළිවෙල | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| ව්‍යාපෘති මූල්‍ය අංශයෙන්දීර්ඝ කාලීන ණය | නව ව්‍යාපෘති,<br><br>ව්‍යාප්ත කිරීම්,<br><br>ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහ ගත කිරීම් , දීර්ඝ<br><br>කාලීන නිත්‍ය ක්‍රියාකාරී ප්‍රාග්ධන අවශ්‍යතා<br><br>සහ වෙනත් අවශ්‍යතා<br><br>මූල්‍ය කරණය වෙනුවෙන් වූ දීර්ඝ කාලීන ණය | ගනුදෙනු කරුවන් විසින් ක්‍රියාත්මක කිරීමට අදහස් කරනු ලබන ව්‍යාපෘතින් හි දීර්ඝ කාලීන අරමුදල් පරතරයන් සපුරාලීමමෙම නිපැයුම මඟින් අපේක්ෂා කරනු ලැබේ. | 1) අමතන්න- අංශ ප්‍රධානි-ව්‍යාපෘති මූල්‍ය අංශය-2347912 හෝ 2448448 : (දිගුව 3387)<br><br>2) නියමිත බලධාරීන්ගෙන් ලබාගත් අනුමැති සහ ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයන වාර්තාව සමඟ අදාළ කර්මාන්ත ක්ෂේත්‍රයට අනුකූල වූ සම්බන්ධතා කළමනාකරු/ ඒකක ප්‍රධානී හමු වන්න.<br><br>3) එවිට සම්බන්ධතා කළමනාකරු ශක්‍යතා වාර්තාව සමාලෝචනය කර අවශ්‍ය නම් පැහැදිලි කිරීමක් කරන මෙන් ඉල්ලුම් කරනු ඇත.<br><br>4) ප්‍රාථමික අධ්‍යයනයෙන් පසු ප්‍රතිපත්තිමය නියමයන් සහ කොන්දේසි ලේඛනය ඉදිරිපත් කරනු ලබන අතර ඒ සඳහා ගනුදෙනු කරුගේ එකඟත්වය අපේක්ෂා කරනු ලැබේ.<br><br>5) මෙම ලේඛනය සඳහා එකඟත්වය ලැබුණු පසු ආරම්භක අවසරය පතා ව්‍යාපාරික අංශය විසින් ප්‍රාථමික වාර්තාවක් ණය කමිටුව වෙත යොමු කරනු ලැබේ.<br><br>6) ආරම්භක අවසරය ලැබුණු පසු, විස්තරාත්මක විමර්ශනය ආරම්භ කරනු ඇත. | ව්‍යාපෘති මූල්‍ය පහසුකම් සඳහා වූ සම්මත කොන්දේසි පහත දැක්වෙන පරිදි වේ. එසේ වෙතත් ව්‍යාපෘතියේ ස්වභාවය අනුව මෙම කොන්දේසි ව්‍යාපෘතියෙන් ව්‍යාපෘතියට වෙනස් විය හැකිය. තවද මෙම කොන්දේසි පිළිබඳව සාකච්ඡා කර තිරණ ගත හැකිය.<br><br>1) අරමුදල් යෙදවුම් ව්‍යුහය - ණය: ස්ව ප්‍රාග්ධනය - 60 : 40 ස්ව ප්‍රාග්ධනය පළමුව ගෙන ආ යුතුය.<br><br>2) පොලී අනුපාතය - පොලිය මාසිකව ගෙවිය යුතුය.<br>• ශ්‍රී ලංකා රුපියල්වලින් ලබා ගන්නා ණය සඳහා AWPLR+ වර්ෂයට 2.0 % සිට 3.0 % දක්වා.<br>• ඇ.ඩො.වලින් ලබා ගන්නා ණය සඳහා සඳහා LIB0R + වර්ෂයට 6.0 % සිට 8.5 % දක්වා.<br>• අවකරණ ශේෂය මත පොලිය ගණනය කරනු ලබන අතර මාසික පොලිය මාසය අවසානයේ ගෙවිය යුතුය.<br><br>3) ආපසු ගෙවීමේ කාල සීමාව -<br>• සහන කාලය ද ඇතුළත්ව වසර 1.5 සිට වසර 10 දක්වා<br>• සහන කාලය: මාස 1 සිට වසර 2 දක්වා<br><br>4) මුල් මුදල ආපසු ගෙවීම -<br>• මාසිකව ගෙවිය යුතුය.<br>• ව්‍යාපෘතියේ, සමාගමේ මුදල් ප්‍රවාහයට සරිලන පරිදි වාරිකය ව්‍යුහ ගත කරනු ලැබේ.<br><br>5) සුරැකුම් -<br>• ව්‍යාපෘතියේ ස්වභාවය මත රඳා පවතිනු ඇත.<br>• පොදුවේ ගත් කළ- ව්‍යාපෘතියේ, සමාගමේ වත්කම්, සමාගම් කොටස්, සංස්ථාපිත ඇපකර, පුද්ගල ඇපකර සහ විස්තරාත්මක විමර්ශනය අවසානයේ අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් සුරැකුම්, |

| | | | | |
|---|---|---|---|---|
| | | | 7) විස්තරාත්මක නියමිත විමර්ශනය සඳහා ගත විය හැකි කාලය ව්‍යාපෘතියේ සංකීර්ණභාවය සහ සේවා දායක විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු වල ප්‍රමාණාත්මකභාවය මත රඳා පවතිනු ඇත.<br><br>8) නියමිත විමර්ශනය සම්පූර්ණ වීමෙන් පසු සහ අදාළ බලධාරි අනුමැතිය ලබා ගැනීමෙන් පසු පහසුකම් අර්පණ ලිපිය, ගිවිසුම් සේවා දායකගේ පිළිගැනිම සඳහා ඉදිරිපත් කරනු ඇත.<br><br>9) නීතිමය සුරැකුම් ලේඛණයන් පිළිබඳ අවශ්‍යතා සම්පූර්ණ කරනු ලැබීමෙන්, කලින් එකඟ වූ ණය/ ස්ව ප්‍රාග්ධන අනුපාතයන් සපුරාලීමෙන් පසු සහ ව්‍යාපෘතියේ ඒ ඒ පියවර සඳහා කලින් එකඟ වූ කොන්දේසි සම්පූර්ණ කරනු ලැබීමේදි ණය ප්‍රමාණයන් මුදා හැරීම කරනු ඇත.<br><br>10) නියමිත ව්‍යාපෘතියේ විවිධ පියවර වලදී බැංකු නිලධාරීන් විසින් ව්‍යාපෘති පරිශ්‍රය / සමාගම නිරීක්ෂණය කරනු ඇත.<br><br>11) පැමිණිලි කිරීම් සඳහා වූ ක්‍රියා පිළිවෙල - ව්‍යාපෘති මූල්‍ය අංශයේ සහකාර උප සභාපති වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. | • ණය යෝග්‍යතාවය ශක්තිමත් කරනු සඳහා අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් සුරැකුම්,<br><br>6) ගාස්තු :-<br>• ප්‍රාරම්භක ගාස්තු : යෝජිත ණය පහසුකමෙන් 0.25 % සිට 1.5 % දක්වා<br>• නෛතික ගාස්තු: පහසුකමෙන් 0.2 % ක් පමණ<br>• මුද්දර බදු සහ වෙනත් ව්‍යවස්ථාපිත ගාස්තු : රජයේ නියාමනයන්ට අනුව වේ.<br>• අවලංගු කිරීමේ ගාස්තු : 0.75 %<br>• බැඳුම්කරු ගාස්තු : 1 %<br>• පෙර ගෙවුම් හානි සඳහා වූ වන්දි : නියමිත කාලයට පෙර ගෙවන මුදල සහ පහසුකමේ ආපසු ගෙවීම සඳහා වූ ඉතිරි කාල සීමාව අනුව පදනම් වූ ප්‍රතිශතයක් අය කෙරේ.<br>• ණයවර ලිපි / නැවිගත කිරීම් ඇපකර / බැංකු ඇපකර ගාස්තු : බැංකුවේ සම්මත ගාස්තු ව්‍යුහය අනුව වේ.<br>• අමතර ගාස්තු : එකිනෙක අවස්ථානුකූලව වේ.<br>• වෙනත් ගාස්තු<br><br>ව්‍යාපෘති මූල්‍ය පහසුකම් සඳහා වූ සම්මත කොන්දේසි පහත දැක්වෙන පරිදි වේ. එසේ වෙතත් ව්‍යාපෘතියේ ස්වභාවය අනුව මෙම කොන්දේසි ව්‍යාපෘතියෙන් ව්‍යාපෘතියට වෙනස් විය හැකිය. තවද මෙම කොන්දේසි පිළිබඳව සාකච්ඡා කර තීරණ ගත හැකිය.<br><br>1) අරමුදල් යෙදවුම් ව්‍යුහය<br>• එන්.ඩී.බී හි සහභාගිත්වය :ණය යෝගිතා රුචිකත්වය මත නිකුතු වටිනාකමින් 0 % සිට 100 % දක්වා ප්‍රමාණයක් වේ.<br><br>2) පොලී අනුපාතය<br>• කාලපූරණ අවස්ථාවේදී පොලිය ගෙවිය යුතුය.<br>• ශ්‍රී ලංකා රුපියල් සඳහා AWPLR+ වර්ෂයට 2.0 % සිට 3.0 % දක්වා වේ.<br>• සංයුක්ත කළ පදනම මත පොලිය ගණනය කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| අනාගත ලැබිය යුතු මුදල් සුරක්ෂිත පත් ගත කිරීම | මූල්‍ය/කල්බදු සමාගම්, වැවිලි සමාගම් සහ සිල්ලර ව්‍යාපාරික සමාගම් වල අනාගත ලැබිය යුතු මුදල් සුරැකුම්ගත කිරීම මගින් ලබා දෙන ණය පහසුකම් | | 1)ගනුදෙනුව පිළිබඳ අවශ්‍ය සාකච්ඡා ආරම්භ කිරීම සඳහා ඉහත සඳහන් පරිදි එන්.ඩී.බී බැංකුව අමතන්න, නැතහොත් 2300385 ඔස්සේ එන්.ඩී.බී ආයෝජන බැංකුව (එන්.ඩී.බී.අයි.බී) අමතන්න.<br><br>2) එන්.ඩී.බී ආයෝජන බැංකුව (එන්.ඩී.බී.අයි.බී) විසින් මූලික විමර්ශනය සිදු කර සුදුසු කොන්දේසි එන්.ඩී.බී බැංකුව වෙත දන්වනු ඇත.<br><br>3) එන්.ඩී.බී.අයි.බී විසින් ව්‍යාපෘතියට අදාල තොරතුරු එන්.ඩී.බී බැංකුව වෙත ලබා දෙනු ලැබේ.<br><br>4) එය ලද විට එන්.ඩී.බී බැංකුවෙහි සම්බන්ධතා කළමනාකරු විසින් යෝජිත ගනුදෙනුව සහ සුරැකුම් පත් නිකුත් කරන සමාගම සමාලෝචනය කරනු ඇත.<br><br>5) ඉන්පසු සම්බන්ධතා කළමනාකරු විසින් මූලික අවසරය පතා ප්‍රාථමික වාර්තාවක් ණය කමිටුව වෙත යොමු කරනු ලැබේ.<br><br>6) මූලික අවසරය ලද විට විස්තරාත්මක නියමිත විමර්ශනය සිදුකර පහසුකම සඳහා නිල අනුමැතිය ලබා ගනු ඇත. | 3) ආපසු ගෙවීමේ කාල සීමාව -<br>• වසර 1.5 සිට 4 දක්වා<br>• සහන කාලය: මාස 1 සිට 2 දක්වා<br><br>4) මුල් මුදල ආපසු ගෙවීම<br>• මාසික පදනම මත ඔප්පුව කල්පිරීමේදී ගෙවිය යුතුය.<br>• ව්‍යාපෘතියේ, සමාගමේ මුදල් ප්‍රවාහයට සරිලන පරිදි වාරිකය ව්‍යුහගත කරනු ලැබේ.<br><br>5) සුරැකුම්<br>• අනාගත ලැබිය යුතු මුදල් හි පැවරීම<br>• අදාල කර්මාන්තයට, සමාගමට ගැලපෙන පරිදි අවශ්‍ය යයි සලකනු ලබන හෝ ණය යෝග්‍යතාවය ශක්තිමත් කිරීමට වෙනත් සුරැකුම්,<br><br>6) ගාස්තු :-<br>• ප්‍රාරම්භක ගාස්තු : රු 500, 000/- සිට යෝජිත පහසුකමෙන් 0.5 % දක්වා<br>• ESCROW නියෝජිත ගාස්තු පළමු වසරට රු 150, 000/- සහ ඉන් ඉදිරි වසරකට රු 200, 000/- බැගින් වේ.<br>• සංවිධායක ගාස්තු සහ නෛතික ගාස්තු : එන්.ඩී.බී.අයි.බී හි උපදෙස් අනුවයි.<br>• භාරක ගාස්තු : අදාල භාරකරු අනුව තීරණය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | 7) අවශ්‍ය  නීතිමය, සුරැකුම් ලේඛනයන් පිළිබඳ කටයුතු සම්පූර්ණ කරනු ලැබීමෙන් පසු පහසුකම මුදා හැරීම කරනු ඇත.<br><br>8) පැමිණිලි කිරීම් සඳහා වූ ක්‍රියා පිළිවෙල - ව්‍යාපෘති මූල්‍ය අංශයේ සහායක උප සභාපති වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. | |